ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1980 අංක 6 දරන බන්ධනාගාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 35 යි    තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1980 අංක 6 දරන බන්ධනාගාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 92/78.

**බන්ධනාගාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 6 දරන බන්ධනාගාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. බන්ධනාගාර ආඥාපනතේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ 11අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය:— — 54 වන අධිකාරයේ 11අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" බන්ධනාගාර නිලධරයන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමේ දී ඔවුන්ට සිදුවන සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් ස්ථිරව අබලතාව හෝ මරණය සම්බන්ධයෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රීති සෑදීමට ඇති බලය.

11අ. (1) (අ) යම් බන්ධනාගාර නිලධරයකු කාර්ය ඉටු කිරීමෙහි යෙදී සිටිය දී ඔහුට සිදු වූ, හෝ

(ආ) යම් බන්ධනාගාර නිලධරයකු කාර්ය ඉටු කිරීමෙහි යෙදී නොසිටිය දී වුව ද ඔහුගේ සාමාන්‍ය කාර්ය විෂය පථයට අයත් වන්නා වූ යම් ක්‍රියාවක් ඉටු කිරීමේ දී ඔහුට සිදු වූ, හෝ

(ඇ) යම් බන්ධනාගාර නිලධරයකු ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී කරන ලද යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට සිදු වූ, හෝ

(ඈ) යම් බන්ධනාගාර නිලධරයකු ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහු විසින් කරන ලද යම් ක්‍රියාවකින් සිදු වූ හෝ උද්ගත වූ යම් පළිගැනීමේ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට සිදු වූ

යම් තුවාලයක හේතුවෙන් අවස්ථාවෝචිත පරිදි සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ස්ථිර ලෙස අබලතාවකට පත් වූ යම් බන්ධනාගාර නිලධරයකුට නැතහොත් මියගිය යම් බන්ධනාගාර නිලධරයකුගේ නීත්‍යානුකූල උරුමක්කරුවකුට හෝ උරුමක්කරුවන්ට, වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් පිහිටුවීම සඳහා සහ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකි ය. ඒ වන්දි ප්‍රදානය කරනු ලබන්නේ යම් ප්‍රතිපත්ති,

2- ඒ 46544—11,200 (79/11)

ව්‍යතිරේක, සීමා කිරීම් සහ කොන්දේසිවලට අනුකූලව සහ යටත්ව ද ඒ ප්‍රතිපත්ති, ව්‍යතිරේක, සීමා කිරීම් සහ කොන්දේසි සඳහා ද ඒ යෝජනා ක්‍රමය පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ උචිත කාරණා සඳහා ද ඒ රීතිවලින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ සාදනු ලැබූ රීතිවලට අනුකූලව ප්‍රදානය කරනු ලැබූ යම් වන්දියක් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ සාදනු ලැබූ රීති කිසිවක් යටතේ වන්දි ගෙවිය යුතු ද නැද්ද යන්න හෝ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය පිළිබඳව ආරාවුලක් ඇතිවන යම් අවස්ථාවක දී, ඒ ආරාවුල අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන යටතේ සාදනු ලැබූ රීතිවලට අනුකූලව බන්ධනාගාර නිලධරයකුගේ අබලතාවක් හෝ මරණය හෝ පිළිබඳව ප්‍රදානය කරනු ලැබූ යම් වන්දියක්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඒ අබලතාව හෝ මරණය හෝ සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබූ යම් විශ්‍රාම වැටුපකට, පාරිතෝෂිකයකට, වන්දියකට, දීමනාවකට හෝ වෙනත් අර්ථලාභයකට අමතරව විය යුතු ය.

(5) මේ වගන්තියෙහි කාර්ය සඳහා " බන්ධනාගාර නිලධරයා " යන්නෙන් බන්ධනාගාර කොමසාරිස්වරයා, නියෝජ්‍ය බන්ධනාගාර කොමසාරිස්වරයා සහ බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ නිලධර යන් අදහස් වන අතර, බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි සේවයෙහි නියුක්ත කර ගෙන ඇති වෙනත් යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ. ".